# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2089/15 – 2018 සැප්තැම්බර් 17 වැනි සඳුදා – 2018.09.17**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/22/04/2010.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2016.08.22 වන දින අංක 1981/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2016.08.16 වැනි දින දරන නියෝගයෙන්,

ඩී. ජී. විජේරත්න මයා, අංක 187/2, තොටුපලවත්ත, අලවතුගොඩ.

සහ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.

අතර පවත්නා 2016.07.25 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පී. නවරත්න මහතා වෙත යොමු කරන ලදී.

1A – G 28547 – 22 (2018/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2016.08.16 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

10 - 13/1

---

මගේ අංකය: IR/22/04/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ඩී. ජී. විජේරත්න මයා, අංක 187/2, තොටුපලවත්ත, අලවතුගොඩ.

සහ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර, හෙද පුහුණු විදුහල, විදුහල්පති නිල නිවස, එල්. ආර්. සුමතිපාල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/04/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩී. ජී. විජේරත්න මයා, අංක 187/2, තොටුපලවත්ත, අලවතුගොඩ.

සහ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මාණ්ඩලික සහකාර (පොත් තබන්නා) තනතුරෙහි සේවයේ යොදවා සිටි ඩී. ජී. විජේරත්න මහතාට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබාදුන් සහකාර අභ්‍යන්තර විගණක තනතුරට උසස් කිරීම 2008.02.05 දිනට පෙරදතම කරන මෙන් හා එකී තනතුර සහකාර මුල්‍යාධිකාරි වශයෙන් සංශෝධනය කර ඒ අනුව අදාල හිඟ වැටුප් හා වෙනත් දීමනා ලබාදෙන ලෙසට ඔහු විසින් කරන ලද ඉල්ලීම යුක්ති සහගත ද යන්න සහ යුක්ති සහගත වන්නේ නම් ඩී. ජී. විජේරත්න මහතාට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ''.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

10 - 13/2.

---

මගේ අංකය: අයිආර්/සීඕඑම්/02/2016/177.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2018.03.14 වැනි දින අංක 2062/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.03.08 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

යූ. ඩී. ඒ. සෙබස්තියන් මයා. ඇතුළු සේවක පිරිස, අංක 466 බී, එළේරමුල්ල, වත්තල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව, අංක 265, වෝඩ් පෙදෙස, කොළඹ 07.

අතර පවත්නා 2018.02.20 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නන්දසේන බැදිගම මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2018.03.08 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

10 – 15/1

මගේ අංකය: අයිආර්/සීඕඑම්/02/2016/177.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

යූ. ඩී. ඒ. සෙබස්තියන් මයා, ඇතුළු සේවක පිරිස, අංක 466 බී, එඬේරමුල්ල, වත්තල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව, අංක 265, වෝඩ් පෙදෙස, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍ය, රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

මැණික්දිවෙල, ශ්‍රී පේමරතන මාවත, අංක 22/1 හි එස්. ජී. සූරියආරච්චි මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/සීඕඑම්/02/2016/177.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

යූ. ඩී. ඒ. සෙබස්තියන් මයා. ඇතුළු සේවක පිරිස, අංක 466 බී, එඬේරමුල්ල, වත්තල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව, අංක 265, වෝඩ් පෙදෙස, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

''ජාතික සංවර්ධන භාරකාර අරමුදලේ සේවය කළ යූ. ඩී. ඒ. සෙබස්තියන් මයා., ජේ. එමිල් රාජන් මයා., එම්. ජී. සුසන්ත මයා., ඩී. ඩී. කුලවීර මිය., එන්. එන්. ජයලත් මයා., ඒ. එච්. ටී. එන්. එස්. වික්‍රමරත්න මිය., යූ. ඩී. ඇන්තනි මයා., ඊ. කරුණාරත්න මයා යන අයට 2007 ජූනි මස සිට 2008 දෙසැම්බර් දක්වා කාලය තුළ ජාතික සංවර්ධන භාරකාර අරමුදල් සමාගමේ සේවය කිරීම වෙනුවෙන් ගෙවන ලද දීමනාව නොගෙවා සිටීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 – 15/2

මගේ අංකය: IR/COM/05/2016/135.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. එම්. ඩබ්ලිව්. බී. කවිසේකර මයා, අංක 39. හීනටිකුඹුර, පිලවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක 13/30, සරත් ලියනගේ මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවින්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2016/135.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. එම්. ඩබ්ලිව්. බී. කවිසේකර මයා, අංක 39. හීනටිකුඹුර, පිලවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයකු වූ කේ. එම්. ඩබ්ලිව්. බී. කවිසේකර මහතාට 2004.02.01 දින සිට ලබාදුන් වේතන වර්ධක 03ක් 2004 මැයි මාසයේ සිට අහිමි කිරීම හා ඊට අදළ ව්‍යවස්ථාපිත හිමිකම් අහිමි කිරීම යුක්ති සහගත ද? එසේ නොවේ නම් ඒ මහතාට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

10 – 14

මගේ අංකය: IR/COM/03/2017/193.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත් වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2018 අප්‍රේල් මස 25 වැනි දින අංක 2068/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018 අප්‍රේල් මස 10 වැනි දින දරන නියෝගයෙන්,

එම්. ජේ. චන්ද්‍රතිලක මයා, වැරැල්ලපත, දම්මල පාර, බල්ලපාන, ගලිගමුව නගරය.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2018 මාර්තු මස 16 වන දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නන්දසේන බැදිගම මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2018 අප්‍රේල් මස 10 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 අගොස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

10-16/1

---

මගේ යොමු අංකය: IR/COM/03/2017/193.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එම්. ජේ. චන්ද්‍රතිලක මයා, වැරැල්ලපත, දම්මල පාර, බල්ලපාන, ගලිගමුව නගරය.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ

ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

මැණික්දිවෙල, ශ්‍රී ජේමරතන මාවත, අංක 22/1, එස්. ජී. සූරියආරච්චි මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවින්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 අගොස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR//COM/03/2017/193.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එම්. ජේ. චන්ද්‍රතිලක මයා, වැරැල්ලපත, දම්මල පාර, බල්ලපාන, ගලිගමුව නගරය.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ v ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) වරයෙකු වශයෙන් සේවය කරන එම්. ජේ. චන්ද්‍රතිලක මහතාට අදල ශ්‍රේණියට හිමි වැටුප් තලය ලබා නොදීම යුක්ති සහගත ද යන්නත් එසේ යුක්ති සහගත නොවන්නේ නම් ලබා දිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 - 16/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.